# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2171/3 - 2020 අප්‍රේල් මස 16 වැනි බ්‍රහස්පතින්දා - 2020.04.16**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත**

5 වැනි වගන්තිය යටතේ නියමය

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 5 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, 2020 අප්‍රේල් මස 09 දිනැති අංක 2170/5 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* උපලේඛනය මගින් දක්වා ඇති සංයෝජිත වර්ගීකරණ අංක 1513.11.11, 1513.11.19, 1513.11.21, 1513.11.29, 1513.19.10, 1513.19.90 යටතට වැටෙන පොල්තෙල් සඳහා අදාළ වන කිලෝ ග්‍රෑමයකට රු. 295ක් වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන්, කිලෝ ග්‍රෑමයකට රු. 195ක් අයකරගෙන, ඉතිරි වටිනාකම අත්හරිනු ලැබිය යුතු බවට මෙයින් නියම කරනු ලැබේ.

මෙම නියමය 2020 අප්‍රේල් මස 17 වැනි දින සිට ආරම්භ වන මාස 03ක් දක්වා වූ කාල සීමාවක් සඳහා, වලංගුව පැවතිය යුතුය.

**මහින්ද රාජපක්ෂ,**
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය.

2020 අප්‍රේල් මස 16 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.